# සොකරි ගැමි නාටකය



10 වසර

## සොකරි ගැමි නාටකය පිළිබඳ හඳුනාගනිමු.

ගැමියා අතරෙහි දීර්ඝ කාලයක සිට පැවැත එන විනෝදාස්වාදය අරබයා පවත්වනු ලබන නාටක විශේෂයක් ලෙස සොකරි ගැමි නාටකය හැඳින්විය හැකි ය. මෙය උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ගැමි නාටක විශේෂයක් වේ. මීට අමතර ව කෝලම්, රූකඩ සහ නාඩගම් යන ගැමි නාටක විශේෂ වෙයි. මෙම ගැමි නාටක සම්ප්‍රදායයන් අනුව කථා පුවත්, චරිත, යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ, ගායන, ඇඳුම් පැලඳුම් ආදියෙහි වෙනස්කම් දක්නට ලැබේ.

## සොකරි ගැමි නාටකය පිළිබඳ තොරතුරු.

ලක්දිව පවත්නා පැරණිම ගැමි නාටක විශේෂයක් වන සොකරි උඩරට, වන්නි හා බදුල්ල ප්‍රදේශවල ප්‍රචලිත ව පවතී. එහි දී ප්‍රධාන වශයෙන් හඟුරන්කෙත, මාතලේ, කොටුවේගොඩ, කොනතලගල, පාතහේවාහැට, සපුලියැද්ද, හපුගස්දෙණිය, හේනවල, ලග්ගල, තලාතුඔය, නිල්දණ්ඩාහින්න, බටුවත්ත, බදුල්ලේ දික්පිටිය, දඹුල්ලේ කළුන්දෑව හා උඩ පේරාදෙණිය යන මේ නියම්ගම් සඳහන් කළ හැකිය.

සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් පූජාර්ථයෙන් කරනු ලබන අභිචාර ක්‍රමයක් ලෙසත් සිදු කරන නිසා මෙය ශාන්තිකර්ම විශේෂයක් බව ඇතැම් අයගේ පිළිගැනීමයි.

## සොකරි කතා පුවත.

කසී දේශයෙහි ගුරුහාමි නමින් යුත් ආඬිගුරෙක් රූමත් යුවතියක වූ "සොකරි" නම් කාන්තාවක සරණපාවා ගනී. විවාහ වී බොහෝ කලක් ගත වන තුරුත් දරු සම්පතක් නොලැබූ බැවින් කතරගම දෙවියන්ට බාරයක් ඔප්පු කිරීම සඳහා ඔවුහු ලක්දිවට පැමිණෙති. ඔවුන් සමග මෙහෙකරුවා වන පරයා සහ කාලි අම්මා ද ලක්දිවට පැමිණෙති. එහි දී පදිංචි වීමට ඉඩමක් සොයන අතරතුරේ දී තඹරාවිට නම් ගමෙහි ඔවුහු පදිංචි වෙති. එක් දිනක් ගුරුහාමි වතුර ගෙන ඒමට යෑමේ දී ගමේ වෙදරාලගේ බල්ලා ඔහුගේ කකුල සපා කයි. ඊට ප්‍රතිකාර කිරීම සඳහා වෙදරාල පැමිණෙන්නේ සොකරිය පිළිබඳ ඇල්මකිනි. ප්‍රතිකාර කිරීමෙන් පසු මැදියම් රැයේ දී වෙදරාල සොකරිය සමග පලා යයි. කතරගම දෙවියන්ට කරන කන්නලව්වකින් පසු මග සලකුණු දැක වෙදරාලගේ නිවසේ සිටි සොකරිය ගුරුහාමි විසින් කැඳවාටගන එනු ලබන්නී ය. කථාව අවසන් වන්නේ වෙදරාලට දාව සොකරියට දරුවකු ලැබීමෙනි. එහෙත් අවසානයේ ගුරුහාමි සොකරි සමග සාමදානයෙන් ජීවත් වෙයි.

සොකරි නාටකයේ කතා පුවත ප්‍රාදේශික වශයෙන් වෙනස්කම් සහිත ය.

## පැවැත්වීමේ අරමුණු.

සොකරි ගැමි නාටය පැවැත්වීමේ අරමුණු ලෙස සශ්‍රීකත්වය වර්ධනය කිරීම සහ සමෘද්ධිය පැතීම දැක්විය හැකි ය. එහි දී ස්ත්‍රියකට දරුවකු ලැබීම මගින් සශ්‍රීකත්වය නිරූපණය කෙරේ. නාට්‍ය අවසානයේ සොකරිය ලබන දරුවා සුරතල් කිරීම ද දරුවා ප්‍රේක්ෂකයන්ට පිළිගැන්වීම ද අවසානයේ කෙරෙන සෙත් පැතීම ද කෘෂිකාර්මික සමාජයේ සමෘද්ධිය සංකේතවත් කරයි.

තවත් අරමුණක් ලෙස පූජාර්ථයෙන් ද එනම් පත්තිනි දෙවියන් ඇදහීමට ආරම්භ වූ පූජෝත්සවයක් ලෙස ද මෙය හැඳින්විය හැකි ය. ස්ත්‍රියක පතිවත රැකීමේ අවශ්‍යතාවයත්, පතිවත රැකීම නිසා ඇය කෙරේ ඇති වන බලයත් මෙම නාටකය තුළ දී විග්‍රහ කෙරේ. මෙය සනාථ කරනු ලබන ගායනා ලෙස,

හෙට්ටිරාල බැහැ දැක සැල කළ විට
නැටුම නියම වුණි සත් දෙන හට
සොකරි බාර වුණි පත්තිනි අම්මට
එදා තමයි මුල සොකරි නැටීමට

"සොකරිය රැකදෙන් පත්තිනි අම්මා"
(නැගි කවි)

"සත්පතිනි දෙවිඳුට බාර ය සොකරි එම විට"
(සොකරි කවි)

එසේ ම කතරගම දෙවියන් ඇදහීමට අවස්ථාවක් කොට ගෙන ඇති බැවින් ද සොකරි නාටකය පූජාර්ථය මුල් කර ගෙන පවත්වනු ලබන බව පැහැදිලි වේ.

අතීතයේ ගොයම් කපා අස්වනු නෙළාගත් පසු ව විවේක සුවයෙන් කල් ගෙවන ගැමියෝ වෙසක්, පොසොන් (අප්‍රේල්. මැයි, ජූනි) මාසවල දී මෙම නාටකය රඟ දැක්වූහ. එහි දී හාස්‍ය රසයෙන් පිරි සොකරි නර්තනයක් රඟ දැක්වීමෙන් හා නැරඹීමෙන් ගැමියෝ මහත් වූ ආස්වාදයක් ලැබූ හ. ඒ අනුව ගැමි සමාජයේ සාමූහික ව පවත්වනු ලබන සොකරි සශ්‍රීකත්වය සහ විනෝදාස්වාදය අරමුණු කර ගෙන රඟ දක්වනු ලැබූ බව තහවුරු වේ.

තව ද මෙය ප්‍රදේශයට, රටට සිදු වන්නා වූ නොයෙක් වසංගත රෝග හා ස්වාභාවික විපත් ආදියෙන් ආරක්ෂා වී සෙත් ශාන්තියක් උදා කර ගැනීම ද සොකරි නාටකය පැවැත්වීමේ තවත් අරමුණකි.

වර්තමානයේ දී ගැමි නාටක අභාවයට යා නොදී සංරක්ෂණය කර ගැනීමත්, පාසල් ශිෂ්‍යයන් අධ්‍යාපනික අවශ්‍යතා අරමුණු කරගෙන සොකරි නාටකය රඟ දක්වනු ලැබේ.

## සොකරි නාටකයේ වාදනය

සොකරිනාටකය සඳහා එක් එක් ප්‍රදේශ වශයෙන් වාදන භාණ්ඩ භාවිතයේ දී බොහෝ පළාත්වල උඩරට ගැට බෙරය ද, වන්නි ප්‍රදේශවල උඩැක්කිය ද, ඌව ප්‍රදේශයේ දවුල ද ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනෙන අතර, තාලම්පට තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස පොදුවේ යොදා ගැනේ.

මෙම වාදන බාණ්ඩ එක් ව වාදනය නොකරන අතර බහුල ව වාදනය කරනුයේ ගැටබෙරය යි. අතීතයේ දී හොරණෑව ද සොකරි නාටකය සඳහා යොදා ගෙන ඇති අතර වර්තමානයේ දී හොරණෑ වාදකයෙකු දක්නට නොමැත.

"දොංජිජිගත" යන බෙර පදය ආරම්භයේ සිට අවසානය තෙක් වැඩි වශයෙන් භාවිත කෙරේ. මීට අමතර ව ශාස්ත්‍රීය වාදනයක් යොදා ගන්නා බවක් දක්නට නැත. කථා වස්තුව රඟදැක්වීම සහ චරිත ප්‍රේක්ෂකයාට හඳුන්වා දීම සඳහා සරල පද හා ගමන් තාල පද වාදනය කරනු ලැබේ.

## ගායනය

සොකරි නාටකය තුළ ගායනයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ආරම්භයේ සිට අවානය තෙක් ම රඟ දක්වන සිද්ධිවල හා චරිතවල ස්වභාවයන් හඳුන්වන්නේ කවි ගායනයෙනි. පොතේ ගුරුන්නාන්සේ ගායනා කරන සෑම පේළියක් ම යළිත් අත්වැල් ගායකයෝ ගයති. මෙහි දී ආරම්භයේ දී හා අතරමැද දී අනාසානාත්මක ව කවි යොදා ගනු ලැබේ.

පෙර සම්මතේ දී - වහං දහ අට බෙදී
දේශ දහ අට සෑදී - කසී දේශේ නමින් සුසැදී

සොකරි ගායනාවල දී ගුරුහාමි පිළිබඳ වත්, ඔහුට පරයා සහ සොකරිය හමු වූ ආකාරය පිළිබඳ වත්, ලංකාවට පැමිණීමට තීරනය කර ගන්නා අවස්ථාව දක්වාත් කෙටි හැඳින්වීමක් කවි මගින් ඉදිරිපත් කෙරේ. එසේ ම සත් මුහුදු තරණය කොට ලංකාවට ගොඩ බැසීම පිළිබඳව ද ගායනය කරනු ලැබේ.

තුන් මස් තුන් පෝයක් ගත වන්නේ
මහ ජල මුහුදේ නැව පොඩි වන්නේ
ඉතින් මෙ අපි කොහොම ද ගැලවෙන්නේ
රුහුණු රටට ගොඩ බසිමු කියන්නේ

සොකරි නාටකයේ චරිත රඟබිමට ආරාධනා කිරීම සඳහා කවි යොදා ගන්නා අතර. චරිත ස්වභාවය පිළිබඳ හඳුන්වා දීමට ද ගායනා යොදා ගැනේ. එහි දී සොකරිගේ චරිතය පිළිබඳ මෙලෙස විස්තර කෙරේ.

අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙළන්නී
තෝඩු දමන්නී පවලම් මාල බඳින්නී
සේල අඳින්නී පටකින් ඔමරි කරන්නී

## රංග වස්ත්‍රාභරණ සහ රංග භාණ්ඩ භාවිතය

### ★ ගුරුහාමි

වෙස් ගැන්වීම උඩරට වෙස් නැට්ටුවෙකුගේ ඇඳුම ඇසුරින් නිර්මාණය කර ඇත. එහි පහළ කොටස උඩරට වෙස් නර්තන ශිල්පියකුගේ ඇඳුම් කට්ටලයට බෙහෙවින් සමාන ය. එනම් සගලට සමාන ය. ඇතැම් අවස්ථාවල දී ගුරුහාමි ලෙස පෙනී සිටින චරිතය ඉණට පච්චවඩමක් සහ පයට සීලම්බු පලඳී. හිසට මුණ්ඩාසනය පලඳිනුයේ තුන් පැත්තකට තරු තුනක් සේ ය. දෑතේ දෙපයේ සහ පපුවේ මෙන් ම නළලේ ද සුදු පාටින් ඉරි ඇඳ ඇත.

වමත සුරත නළලේ අළු ගාගෙන
දෑස් දෙබැම තේ සෝරු ද ගාගෙන
සිරිත ලෙසට ගඩු ගුඩුව ඇරගෙන
ගනිති නිමිති පොත අතටම ඇරගෙන

### ★ සොකරි



සොකරි උඩරට සාම්ප්‍රදායික කාන්තාවකගේ ස්වරූපයට සමාන වන සේ ඔසරියකින් හැඩගන්වා ඇති අතර අතට සහ පයට සිහින් ගෙජ්ජි ද, කරට ඇට මාල ද, කනට කරාබු ද, අතට වීදුරු වළලු ද පලඳා ඇත. සොකරි නාටකයේ ගැහැනු චරිත පිරිමින් රඟපාන බැවින් බොරු කොණ්ඩයක් පලඳී. කොණ්ඩය මල් වැලකින් සරසයි.නළල් පටියක් ද පලඳින අතර, අතෙහි මල් පොකුරක් ද ඇත. ඇතැම් ප්‍රදේශවල මල් පොකුර වෙනුවට ලේන්සුවක් භාවිත කරයි.

### ★ පරයා

පරයා කොට කලිසමක් හා කමිසයක් අඳිනි අතර එය තරමක් ඉරුණු ස්වරූපයක් පෙන්වයි. කොළපතකින් සාදන ලද වෙස් මුහුණක් පලඳී. හිසට කේතුවක ආකාරයට හිස් වැස්මක් ද පැලඳ සිටී. ඇතැමෙක් එය කොළපතකින් සකසා ගොප්කොළ යොදා අලංකාර කර ගනිති.

අතේ දිග සැරයටියක් ද රෙදිවලින් මැසූ මල්ලක් ද වෙයි.

### ★ වෙදරාල

කොණ්ඩය පිටුපසට බැඳ සිටින අතර, කණ්ණාඩියක් සහ දිගු රැවුලක් පැලඳ සිටී. කුදු බව පෙන්වීමට පිටට කොට්ටයක් බැඳ ඇත. එමෙන් ම බඩ ඉදිරියට නෙරා ඇති බව පෙන්වීමට කොට්ටයක් ද බැඳ ඇත. මේස් බැනියමක් ඇඳ ඊට උඩින් කෝට් කබායක් ද සරමක් ද ඇඳ ඉණට පටියක් ද බැඳ අතට සැරයටියක් ගෙන නටයි.

### ★ කොස්තානා

වෙදරාලගේ පුතා ලෙස හඳුන්වන කොස්තානා කුඩා දරුවකු මෙන් සරසා ඇත.කොට කලිසමක් සහ බැනියමක් ඇඳ සිටී. කොළපතකින් සකස් කළ වෙස් මුහුණ කුඩා දරුවකුගේ ස්වභාවය ප්‍රදර්ශනය කරයි. සූප්පුවක් කරේ එල්ලා ඇති අතර බොහෝ අවස්ථාවන්හි වෙස් මුහුණෙහි කටට සූප්පුව තබා ගෙන නර්තනය ඉදිරිපත් කරයි.

## සොකරි නාටකයේ චරිත නිරූපණය පිළිබඳ විචාරය

සොකරි නාටකයේ ආඬිගුරු හෙවත් ගුරුහාමි සොකරි, පරයා, වෙදරාල යන චරිත ප්‍රධාන චරිතය. මෙම චරිතවල ස්වභාවය එකිනෙකට වෙනස් වේ. චරිත නිරූපණය කිරීමේ දී ඔවුන්ට ආවේණික වූ ගමන් තාල, අංග ලක්ෂණ, බෙර පද, කවි ගායනා, නර්තන විධි ඉදිරිපත් කරනු ලැබේ.

★ **ගුරුහාමි**

ගුරුහාමි යනු ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයෙන් පැමිණි තැනැත්තෙකු ලෙස හැඳින්වේ. මොහු තරමක් වයස්ගත පුද්ගලයෙකි. එම නිසා චරිත නිරූපණය ඊට අනුගත ආකාරයෙන් සිදු කරන අතර, මොහුට සිංහල බස කතා කිරීමට ඇති අපහසුතාවක් දෙබස් මගින් ඉදිරිපත් කෙරේ. ඔහු සිංහල වචන වැරදි ලෙස උච්චාරණය කිරීම නිසා අකරතැබ්බයන්ට මුහුණ දෙයි. ඒවා හාස්‍යෝත්පාදනය කරන අවස්ථාවන් ලෙස දැක්විය හැකි ය. ගුරුහාමි රඟමඩලට පිවිසීමේ දී කවි ගයන අතර, එම ගායනාවලට අනුව නටයි. එමගින් ඔහු නැටුම් ශිල්පය ප්‍රගුණ කළපුද්ගලයෙකු බව විදහා දක්වයි. ඔහු නටනුයේ උඩරට නැටුම් බව පැහැදිලි ය. ගුරුහාමිගේ චරිතය සඳහා ද "දොංපි පිගත" බෙර පදය වාදනය කරයි. එම බෙර පදයට සහ කවියට අනුව නටමින් රඟමඬල වටේට ගමන් කරයි.

| | |
|---|---|
| දේශයේ සිට ආ එගුරු | මහල්ලා |
| දියට යන්ට ලබු ගෙඩියක් | එල්ලා |
| තඹරාවිට වෙදරාලගේ | බල්ලා |
| ගුරුවගෙ කකුලක් කාපි | බොලල්ලා |

★ **සොකරිය**

සොකරි නාටකය තුළ රඟ දක්වන ප්‍රධාන ම කාන්තා චරිතය වන මැය, ඉතා රූමත් තරුණියකි. ඇයගේ ගමන කලාත්මක ය. ලයාන්විත ය. ශෘංගාරාත්මක රසයක් මතු වන ආකාරයෙන් බෙර පදයට සහ ගායනයන්ට අනුව අංග චලනය දක්වමින් ගමනෙහි යෙදේ. එසේ ම සොකරිය නාටකය තුළ දී කතා නොකරන බැවින් බොහෝවිට බිම බලා ගෙන ඇස්වලින් ඉඟිබිඟි පාමින් රංගනයේ යෙදීම එම චරිතයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය. මැය ලජ්ජාශීලී ස්ත්‍රියක ලෙස රංගනයේ යෙදේ. සොකරි සඳහා ද "දොංපි පිගත" බෙර පය වාදනය කරන අතර, ඇය රංගනයට ප්‍රවිෂ්ට වීමේ දී මෙවැනි ගායනාවන් සිදු කරයි.

| | |
|---|---|
| සොකරි එන්නී සබයෙන් අවසර | ගන්නී |
| නැටුම් නටන්නී තාලෙට රාග | කියන්නී |
| පද අල්ලන්නී පියුරු ළැම | සොලවන්නී |
| කැඩපත ගන්නී සුරතින් මූණ | බලන්නී |

★ **පරයා**

සොකරිගේ සහ ආඬිගුරුගේ අතවැසියා වන පරයා. මුඛරි බසින් යුක්ත ය. ගුරුහාමිත් ප්‍රේක්ෂකයාත් සම්බන්ධ කිරීමට අතරමැදි වන චරිතය ලෙස පරයා හඳුන්විය හැකි ය. මොහු විකට ස්වරූපයකින් යුක්ත වන අතර, ප්‍රේක්ෂකයාට හාස්‍ය රසයක් ලබා දෙමින් බෙර පදයට සහ ගායනයට අනුව වටේට නටයි. වරින් වර සොකරිය සෙ ගිජු බැලුම් හෙළයි. පරයාගේ නැටුම් පිළිවෙළකට නොකරන අතර. බෙර තාලයට අනුව උඩ පනිමින් අතපය විසි කරමින් හාස්‍යෝත්පාදනය වන අයුරින් චරිතය නිරූපණය කරයි.

| | |
|---|---|
| ඉතින් කියන්නේ තුන්වෙනි වරට | නටන්නේ |
| පරයා එන්නේ වටපිට නිතර | බලන්නේ |
| කට දොඩවන්නේ ගිය ගිය තැන | පෙරළෙන්නේ |
| කොක් හඬලන්නේ සෙකරිය දෙසයි | බලන්නේ |

පරයාගේ චරිත නිරූපණය කිරීමේ දී සිංහල බස උච්චාරණය කිරීමට ඇති අපහසුතාව පෙන්වමින් චරිතය රඟ දක්වනු ලැබේ.

| | | |
|---|---|---|
| **ගුරුහාමි** | - | ඉතිං මුන්නැහැ මේ මෙච්චර දුර රටක ඉඳල මොකට ද මෙහාට ආවේ. |
| **පරයා** | - | හාවෙද හාවෙ පෝම විශල සාජකාලියකට |
| **පොතේ ගුරු** | - | මොකක් ද අප්පේ ඔය මහ ලොකු රාජකාරිය ? |
| **ගුරු** | - | ඔව් ඔව් මහා ලොකු රාජකාරියක් බව නම් තේරෙනවා කරේ තියෙන මල්ලෙන් ම |
| **පොතේ ගුරු** | - | ඇත්තට ම උන්නැහෙ මොනවද ඔය මල්ලෙ ? |
| **පරයා** | - | මී කෙද? මී කෙද මීකේ ආල්සිල්ලර |
| **පොතේ ගුරු** | - | මොනවලු |
| **ගුරු** | - | ආල්සිල්ලරලු, මං හිතන්නෙ හාල් සිල්ලර වෙන්න ඇති. |
| **පොතේ ගුරු** | - | ඉතිං අපි අහපු එකට තාම උත්තර ලැබුණේ නෑනේ. |
| **ගුරු** | - | ඒක තමයි මොකක් ද ඔය ලොකු රාජකාරිය. |

**⋆ වෙදරාල**

මොහු වයස්ගත පුද්ගලයෙකු වුව ද ස්ත්‍රී ලෝලියකු ලෙස චරිත නිරූපනය වෙයි. සොකරිය ගුරුහාමිට බෙහෙත් කිරීමට නිවසට ගොස් වෙදරාල කැඳවා ගෙන එන අවස්ථාවේ දී වෙදරාල සොකකරිය පිළිබඳ දක්වන කෑදරකමත්, ඔහුගේ සල්ලාලකමත් ප්‍රේක්ෂකයා සිනා ගන්වමින් ඉදිරියේ දී සිදු විය හැකි දේ පිළිබඳ ව කිසියම් ඉඟියක් ලබා දෙමින් ඔහුගේ චරිතය නිරූපණය වෙයි. විශේෂ අවස්ථාවක් ලෙස සොකරිය නැවත කැඳවා ගෙන ඒමට ගුරුහාමි වෙද ගෙදරට ගිය අවස්ථාවේ දී ඇති වූ දබරය දැක්වේ. එහි දී වෙදා සොකරිගේ එක අතකින් අදින අතරගුරුවා අනිත් අතින් අදී. මෙම ජවනිකාව ඉතා හාස්‍ය ජනක ය. (වෙදරාල වයෝවෘද්ධ බැවින් හැරමිටි ගසමින් දබර කර ගියි.) මේ ආකාරයටනිරූපණය වන චරිතයෙන් වෙදරාලගේ මහලු බව හා ස්ත්‍රී ලෝලීත්වය ප්‍රදර්ශනය කෙරෙයි.

වෙදා නටන්නේ සබයේ තැන තැන යන්නේ
යොදා කියන්නේ තාලෙට පද අල්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
වෙදා පාන්නේ අත් දෙක නැගී තියෙන්නේ

## ගැමි නාට්‍ය සංරක්ෂණය කර ගැනීම සඳහා යෝජනා

- සෑම වර්ෂයකට ම වරක් වත් පාසල් සිසුනට සහ මහජනතාවට රස විඳීම සඳහා එම ගැමි නාටක රඟ දක්වමින් සන්දර්ශන පැවැත්වීම.
- ගැමි නාටක කලාව පිළිබඳ ව ග්‍රන්ථ රචනා කිරීම.
- ගැමි නාටක රඟ දක්වන අවස්ථා රූ ගත කොට ශ්‍රව්‍ය දෘශ්‍ය පට සම්පාදනය කිරීම.
- ගැමි නාට්‍යවල ඇති වටිනාකම් අගයමින් පුවත්පත් සඳහා ලිපි සකස් කිරීම.
- රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි ජනමාධ්‍ය මගින් සිංහල ගැමි නාටක කලාව පිළිබඳ වැඩසටහන් නිර්මාණය කර විකාශනය කිරීම.

# කාර්ය පත්‍රිකාව

1. සොකරි ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු 02 ක් නම් කරන්න.

2. සොකරි ගැමි නාටකය හුදු විනෝදාස්වාදය සඳහා ම පවත්වන්නක්ද?

3. සොකරිය ඇතුළු පිරිස ලංකාවට පැමිණීමට හේතු දක්වන්න.

4. සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ නම් කර, එම ප්‍රදේශවල භාවිත කරන වාද්‍ය භාණ්ඩ නම් කරන්න

5. සොකරි නාටකයේ රඟ දක්වන චරිත ස්වභාව විස්තර කිරීම සඳහා ගායනා ඉවහල් වී ඇති බව සනාථ කරන්න.

6. වෙස් ගැන්වීමේ දී ගුරුහාමි ද්‍රවිඩ පුද්ගලයකු බව පෙන්වීමට යොදා ගෙන ඇති උපක්‍රම මොනවාද?

7. සොකරි නාටකය රඟ දැක්වීමේ දී භාවිත කරන රංග භාණ්ඩ මොනවාද?

8. පරයාගේ චරිතය පිළිබඳ අදහස් දක්වන්න.

9. පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | 2 | න් | |
| ජ් | | | | 8 | | | |
| 3 | | ඕ | | ට | | 6 | |
| | | | | | | | |
| | | 5 | | ර | | | 9 |
| 4 | | | | | | 7 සේ | |

**හරහට**


1. උඩරට ගැමි නාටකයට අයත් ප්‍රධාන චරිතයකි.
2. සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයකි.
3. සොකරි නාටකය සඳහා යොදා ගන්නා තල වාද්‍ය භාණ්ඩයකි.
4. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල යොදා ගන්නා පළාතකි.
5. සොකරි ගැමි නාටකය අයත් වන සම්ප්‍රදායය මේ නමින් හැඳින්වේ.
6. සොකරියගේ මෙහෙකාරිය හඳුන්වන නමකි.
7. කවි ගායනාවේ සඳහන් පරිදි සොකරි සැරසී සිටින වස්ත්‍ර මෙනමින් හැඳින්වේ.

**පහළට**

1. වෙදරාලගේ පුතා මෙනමින් හැඳින්වේ.
6. ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර වාසය කළ ප්‍රදේශය යි.
8. සොකරි ගැමි නාටක සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩය යි.
9. සොකරිය කරට පලඳින ආභරණයකි.

සොකරි ගැමි නාටකය නිරූපණය කරන අවස්ථා කිහිපයක් .......












# සොකරි රඟ මඩලේ අනුරුවක්



★ **ප්‍රශ්න අංක 01 සිට 21 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි නාටක මොනවාද ?

(i) සොකරි, කෝලම්, නාඩගම් (ii) සොකරි, කෝලම්, නූර්ති

(iii) සොකරි, නාඩගම්, නූර්ති (iv) නාඩගම්, නූර්ති, රූකඩ

02 සොකරි යනුවෙන් හඳුන් වන්නේ,

(i) උඩරට සම්ප්‍රදායික ගැමි නැටුමකි. (ii) උඩරට සම්ප්‍රදායික ජන නැටුමකි.

(iii) උඩරට සම්ප්‍රදායික ගැමි නාටකයකි. (iv) උඩරට සහ සබරගමු ජන නැටුමකි.

03 සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් වන්නේ කුමක්ද?

(i) හඟුරන්කෙත (ii) පොකුණුවිට (iii) මිරිස්ස (iv) බෙන්තර

04 සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නෙ කුමක්ද ?

(i) හඟුරන්කෙත (ii) මාතලේ කලුන්දාව

(iii) ඔලබොඩුව (iv) කොහතලගල

05 සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් යැයි නොසැලකෙන්නේ,

(i) මාතලේ (ii) බෙන්තර (iii) මහනුවර (iv) වන්නිය

06 සොකරි නාටකයේ දී හමුවන චරිතයක් නොවන්නේ,

(i) ගුරුහාමි (ii) පරයා (iii) සොක්කානො (iv) නොන්චි

07 පරයා, සොක්කානො වැනි චරිත හමුවන්නේ කුමන ගැමි නාටකයේ ද?

(i) නාඩගම් (ii) කෝලම් (iii) නූර්ති (iv) සොකරි

08 ගුරුහාමි, වෙදරාළ යන චරිත ඇතුළත් ගැමි නාටක විශේෂය කුමක්ද?

(i) රූකඩ (ii) සොකරි (iii) කෝලම් (iv) නාඩගම්

09 සොකරි ගැමි නාටකය සඳහා භාවිත රංග භූමිය කුමක්ද?

(i) කරළිය (ii) තානායම්පොළ (iii) කමත (iv) රංග මණ්ඩපය

10 සොකරි රඟ මඩල,

(i) ත්‍රිකෝණාකාර ය (ii) කවාකාර ය (iii) හතරැස් ය (iv) සෘජුකෝණාශ්‍රාකාර ය

11 බදුල්ල දිස්ත්‍රික්කයේ සොකරි නාටකය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ කුමක්ද?

(i) ගැටබෙරය (ii) දවුල (iii) උඩැක්කිය (iv) දික් බෙරය

12 සොකරි නාටකය සඳහා ගැටබෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදාගනු ලබන්නේ කුමන දිස්ත්‍රික්කවල ද?

(i) මහනුවර, මාතලේ, කුරුණෑගල (ii) බදුල්ල, මොනරාගල, මහනුවර

(iii) අනුරාධපුය, පුත්තලම, බදුල්ල (iv) මහනුවර, කුරුණෑගල, බදුල්ල

13 සොකරි නාටකයේ එන චරිත දෙකකි,

(i) සොකරි, ගුරුහාමි (ii) ආඬිගුරු, ගුරුහාමි

(iii) පරයා, පච්චමිරා (iv) සොක්කානා, සොක්කා

14 සොකරි රඟ දැක්වීමේ දී වෙස් මුහුණු නොපළඳින චරිතයක් වන්නේ,

(i) වෙදරාල (ii) සොක්කානා (iii) ගුරුහාමි (iv) පරයා

15 සොකරි රංගනයට අයත් ප්‍රධාන චරිත ලෙස හැඳින්විය හැක්කේ,

(i) සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාල (ii) සොකරි, පච්චමිරා, සොක්කානා, කාලි

(iii) සොකරි, සොක්කා, හෙට්ටියා, වඩුරාල (iv) සොකරි ආඬිගුරු, පරයා, පුලවරු

16 සොකරි නාටකයට අයත් අතුරු චරිත කිහිපයක් ලෙස හැඳින්විය හැක්කේ,

(i) සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාල (ii) සොකරි, පරයා, වෙදරාල, කාලි

(iii) වඩුරාල, හෙට්ටියා. සොක්කානා, කාලි (iv) වෙදරාල, වඩුරාල, ගුරුහාමි, කාලි

17 සොකරි නාටකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ගැහැණු චරිත, ගැහැණු - පිරිමි දෙපාර්ශවයම රඟපාති.

(ii) සමහර චරිත සඳහා වෙස් මුහුණු පළඳී.

(iii) සාමාන්‍ය ජීවිතයේදී භාවිත රංග වස්ත්‍රාභරණ යොදාගනී.

(iv) සරල තාලවලින් යුත් බෙර පද යොදා ගැනේ.

18 සොකරි නාටකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) රංග භූමිය ලෙස කමත යොදා ගැනේ

(ii) ගමට, රටට සෙත් ශාන්තියක් උදා කර ගැනීම නාටකය පැවැත්වීමේ එක් අරමුණකි.

(iii) ශ්‍රී ලංකාවේ දකුණු පළාත් වල ප්‍රචලිතය.

(iv) ප්‍රධාන ගායකයකු හා අත්වැල් ගායකයන් සහභාගී වේ.

19 "වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ" මෙහි මීළඟ පදය කුමක්ද?

(i) විදා පාන්නේ අත්දෙක නැගී කියන්නේ

(ii) කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ

(iii) යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ

(iv) මුදා හරින්නේ හනිකට ගමරට යන්නේ

20 සොකරි නාටකය පුරාවටම දක්නට ලැබෙන බෙර පදය වනුයේ කුමක්ද?

(i) දොං ජිංත ගත දොංත (ii) දොං ජිජ් ගත

(iii) කද ගත ගත දොං (iv) දොදොංත ගතුදොං

21 සොකරි නාටකයේ දී රඹුක් ලීයක් අතෙහි දරාගෙන රංගනයේ යෙදෙන්නේ කවුද?

(i) ගුරුහාමි (ii) සොකරි (iii) පරයා (iv) වෙදරාල

★ **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

22 කමත රංග භූමිය ලෙස යොදා ගන්නේ .................................... නාටකයේ දී ය.

23 වන්නි හත්පත්තුවේ සොකරි නාටකය රඟදැක්වීමේදී ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස ............................ භාවිත කිරීම ප්‍රාදේශීය අනන්‍යතාවයකි.

24 මහනුවර ප්‍රදේශයේ සොකරි නාටකය රඟ දැක්වීමේ දී වාද්‍ය භාණ්ඩ ලෙස ............................ භාවිත කෙරේ.

25 සොකරි නාටකයේ දී මාත්‍රා .............................. තාල රූපයට අයත් බෙර පද භාවිත වේ.

26 "අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී" යනුවෙන් සොකරි නාටකයේ දී හඳුන්වා දෙන්නේ ......................... ගේ චරිතයයි.

27 සශ්‍රීකත්වය පදනම් කරගෙන උඩරට වන්නි පළාත්වල ............................... නාටකය රඟ දැක්වේ.

28 "ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ" යනු ............................ නාටකයේ ............................ නමැති චරිතය හඳුන්වාදෙන කවියක මුල් පදයයි.

29 කොළපත් යොදාගෙන වෙස් මුහුණු නිර්මාණය කරනු ලබන්නේ ........................... නාටකයේදී ය.

30 සොකරි නාටකය පවත්වනු ලබන්නේ ..................................... දේව ඇදහීම මුල් කරගෙන ය.

★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

31 දේශීය ගැමි නාටක 03 ක් නම් කරන්න.

32 සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ 04 ක් නම් කරන්න.

33 සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 03 ක් දක්වන්න.

34 සොකරි නාටකයට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් දක්වන්න.

35 සොකරි නාටකයට අයත් කවි දෙකක් ලියන්න.

36 සොකරි නාටකයෙහි රංග වස්ත්‍රාභරණ හා චරිත නිරූපණය පිළිබඳ කෙටියෙන් සඳහන් කරන්න.

37 සොකරි නාටකය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

38 සොකරි නාටකයේ භාවිතා කරන රංග භාණ්ඩ 03 ක් නම් කරන්න.

39 සොකරි නාටකයේදී සරල වෙස්මුහුණු සාදාගන්නා අමුද්‍රව්‍ය 03 ක් ලියන්න.

40 සොකරි නාටකයේ අදහනු ලබන දෙවිවරුන් කීප දෙනෙක් නම් කරන්න.

41 මෙහි දක්නට ලැබෙන අනුරූපණ අවස්ථා 03 ක් සඳහන් කරන්න.

42 මෙහි රංග ශෛලිය පිළිබඳ කරුණු 03 ක් ලියන්න.

43 මෙය රැක ගැනීමට යෝජනා 03 ක් ඉදිරිපත් කරන්න.

44 මෙහි රංග භූමි ආකෘතිය ඇඳ නම් කරන්න.